**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම**

**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2006/2007**

**නීති ක්‍රම - LWU 1412**

**කාලය - විනාඩි හතලිහයි.**

---

දිනය - 2006.11.08 වේලාව - පෙ.ව.11.45- ප.ව.12.25 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.*

01. නියමිත සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා පමණක් රජයේ රැකියාවන් දියයුතු බවට සෘජු ප්‍රතිපත්තියක් ඉන්ටලෙක්ටියා නැමැති රට මෑතදී පිළිගන්නා ලදී. ඒ අනුව රාජ්‍ය සේවකයන් පත්කළ යුත්තේ උපාධි, ඩිප්ලෝමා හෝ වෙනත් සුදුසුකම් පදනම් කර ගෙනය යනුවෙන් සඳහන් වන්නා වූ නව නීතියක් එරට පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලදී. ඇමතිවරයකුගේ පුතකු වන බීන් මහතා පසුගිය අවුරුදු 10 ක කාලයක් විදේශයන්හි සේවය කළ එහෙත් විධිමත් අධ්‍යාපන සුදුසුකම් නොමැති අයෙකු වන අතර, ඔහුව ඉන්ටලෙක්ටියාහි අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉහළ තනතුරකට මෑතකදී පත් කරනු ලැබීය. මෙම තනතුරට ඔහු පත් කරන ලද්දේ ඔහුගේ විදේශ පළපුරුද්දෙහි වසර ගණන පදනම්වය. නව පාර්ලිමේන්තු පනත අනුව බීන් මහතාව තෝරා පත් කර ගැනීම සඳහා හිමිකම් නැත යන පදනම මත ස්මාට් මහතා විසින් එම පත්වීම අභියෝගයට ලක් කර ඇත.

ස්මාට් මහතාගේ තර්කය සාර්ථක වේදැයි ඔබ විශ්වාස කරන්නේ ද? ව්‍යවස්ථා අර්ථ නිරූපණයේදී අදාළ වන රීතීන් ඇසුරින් ඔබේ පිළිතුර පහදන්න. ශ්‍රී ලංකාවේ අදාළ වන ව්‍යවස්ථා අර්ථනිරූපන රීතීන් ඉන්ටලෙක්ටියා හිද අදාළ වන බව උපකල්පනය කරන්න.

02. අනුගම්‍ය පූර්ව නිදර්ශන න්‍යාය යුක්තිය සඳහා පහසුකම් සලසන්නේ යැයි විශ්වාස කළද අධිකරණ පූර්ව නිදර්ශන සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ බලය සීමා කරමින් යුක්තිය ලබාදීම සහතික කිරීම සඳහා විනිශ්චයකාරවරයාගේ හැකියාව එමගින් ඇත්ත වශයෙන්ම සීමා කරයි.

ඉහත ප්‍රකාශයේ වලංගු භාවය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

- හිමිකම් ඇවිරිණි. -